රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 01/2014 (VI)

මගේ අංකය : EST-2/05/POL/0084
රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ
පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2019.08.07

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## <u>රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම</u>

ඉහත කරුණ සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2014.01.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02 එකී චක්‍රලේඛයේ 03 වන ඡේදයේ I (ඇ) උපඡේදයෙහි විධිවිධාන 2007.07.01 දිනට පසුව සපුරා ඇත්නම් එම සේවා කාලය විකල්ප සුදුසුකම සඳහා අදාළ කර ගැනීමට 2019.05.28 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇත.

03. ඒ අනුව 03 වන ඡේදයේ I (ඇ) උපඡේදය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

> "නිලධරයා සේවයට බැඳුණු රාජ්‍ය භාෂාව නොවන අනෙක් රාජ්‍ය භාෂාව පරිපාලන භාෂාව වශයෙන් භාවිත කරනු ලබන ජනතාව බහුතරයක් වාසය කරන මෙම චක්‍රලේඛයේ කාර්යයන් සඳහා පමණක් අදාළ කර ගත යුතු, ඇමුණුම 02හි සඳහන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක තිබෙන රාජ්‍ය ආයතනයක 2007.07.01 දිනට පසු එක් වර්ෂයක් හෝ එයට වැඩි කාලයක් හෝ සක්‍රීයව සේවය කිරීම ඉහත සඳහන් වාචික පරීක්ෂණය සමත් වීම වෙනුවට විකල්ප සුදුසුකමකි."

04. ඉහත විධිවිධාන හැර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට සංශෝධන ලෙස නිකුත් කරන ලද සියලුම චක්‍රලේඛවල සඳහන් අනෙකුත් කොන්දේසි හා විධිවිධාන එලෙසම තවදුරටත් ක්‍රියාත්මක වේ.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ
පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය